# කසුන්ගේ සුරතලා



තිසෙව්නි සෙහාරා ද සිල්වා

2-D

මහාමායා බාලිකා විද්‍යාලය,මහනුවර.

## පිදුම

**මෙම පොත ලිවීම සඳහා මා දිරිගැන්වූ**

**2-D පන්තිභාර ගුරු මෑණියන්**

**සහ**

**උදව් කළ සියලූ දෙනා හට**

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

ඈත ගමක හිටියා කසුන් කියල පුංචි ළමයෙක්. කසුන්ට යාළුවෝ ගොඩක් හිටියා. ඔහුගේ සුරතලා බල්ලෙක් එයාගේ නම තමයි ටොමී.



එයා හරිම දක්ෂයි. එක දවසක් කසුන් සහ ටොමී දෙන්නම එයාගේ යාළුවොත් එක්ක සෙල්ලම් කරන්න ගියා.



ටොමී ගේ වලස් යාලුවත් එතැනට ආවා. කසුන්ගේ යාළුවෝ හැමෝමත් එතෙන්ට ආවා.



කසුන්ගේ යහලුවන් තමයි රුවන්, පවනි, ටිකිරි සහ රෝසි මේ කට්ටිය රූ වෙනකන් සෙල්ලම් කරා.



රෑ වෙනකම් සෙල්ලම් කරලා හැමෝටම බඩගිනි දැනුණා එතන ලොකු චෙරි ගහක් තිබුණා.



ඒ කට්ටියට ගෙදර යන්න බැරි වුණා.

ගොඩක් රෑ වුණා. යාලුවෝ බය වුණා. දැන් මොකද කරන්නේ? පවනි ඇහුවා.

බය වෙන්න එපා රුවන් කිව්වා. මේ ගහේ වෙරි රසයි. අපි මේවා කාලා බඩගින්න නැති කරගමු.

“අපි දැන් කොහොමද? ගෙදර යන්නේ.?” ටිකිරි ඇසුවා.

“හැමෝටම දැන් ගෙදර යන්න පාර මතක නැනේ .රෑ නිසා හොයාගන්නත් බෑ.

“බය වෙන්න එපා කවුරුවත් .මට ඉව දැනෙනවා.

හැමෝම මගේ පස්සෙන් එන්න. ටොමී යාලුවන්ට කිව්වා”



යාලුවෝ හැමෝම ටොමීගේ පසුපසින් ගියා

සියලු දෙනාගේම එකමුතු භාවයයි, තීක්ෂණ බුද්ධියයි නිසා හැමෝම ගෙදර ආවා. එයාල හැමෝටම හරිම සතුටුයි.



ඔන්න ඔහොම කසුන්ගෙයි

ටොමීගේ එක දවසක් ඉවර වුණා



පුංචි මා හට මෙම පොත ලියා ගැනීමට උදව් කළ සැම දෙනාටම මාගේ හදපත්ලෙන්ම තුති වෙමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20

# Book Details With ISBN

| ISBN | BAR CODE |
|---|---|
| ISBN 978-624-208-127-4 | 9 786242 081274 |

